# පුල්එළියේ දුරස්ත රාජ්‍යය

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික සහ ආයතනික ක්‍රමයන්ට පදනම් වූයේ වැසි ජලය එක් රැස් කර ප්‍රයෝජනයට ගැනීමට සකස් වූ වාරි ජල පද්ධතියකැ'යි කිවහොත් බොහෝ දුරට නිවැරදි ය. රටේ අනෙකුත් ප්‍රදේශ හා සැසඳීමේ දී සාපේක්ෂ වශයෙන් වියළි කලාපයට ලැබෙන්නේ අඩු වර්ෂාපතනයක් වන අතර එය ලැබෙන්නේ ද සීමිත කාල පරිච්ඡේදයක දී පමණි. අතීතයේ වැසි සමයේ දී, හේන් පදනමක් මත ගොඩ භෝග වගා කිරීමට වැසි ජලය උපයෝගී කර ගැණිනි. වියළි කලාපයේ, ඈත අතීතයේ සිට වර්තමානය දක්වාම ස්ථිරසාර පදනමක් මත ඉඩම් අස්වද්දා, වී වගා කොට ආහාර රැස්කර ගබඩා කර තබා ගැනීමට හැකි වූයේ වැවෙහි රැස් කර ගත් ජලය පදනම් කර ගනිමිනි. වැව, කෘෂිකර්මයට පමණක් නොව බීමට, නෑමට, ඇඳුම් පවිත්‍ර කර ගැනීමට මෙන්ම සත්ත්ව පාලනයට ද ජලය සැපයූ මාර්ගය විය. මෙයට අමතරව මසුන් බෝ කිරීම තුළින් වැව, ගම්මානවල ජනතාවට මාංශජනක ධාතු ලබා ගත් මාර්ගයක් වශයෙන් ද දක්විය හැකිය. බෞද්ධ ආගමත්, වැවත්, පන්සලත් අතර ඇත්තේ ඓතිහාසික සමීප සම්බන්ධයකි. බෞද්ධ චෛත්‍යය ගොඩ නැඟුනේ වැවෙන් ලබාගත් පස් භාවිතා කරමින් වන අතර වාරි ජලය පදනම් කරගත් කෘෂි ආර්ථිකය, පන්සල පදනම් කරගත් සංස්කෘතික සහ ආයතනික ක්‍රමයක් පවත්වාගෙන යාමට ඉවහල් විය. මේ නිසා වියළි කලාපයේ ජීවනාලිය වූයේ ඉඩම්වලට වඩා ජලයයි. විශාල වැව් තැනුවේ රාජ්‍ය අනුග්‍රහය යටතේ ය. ස්වභාවික ජලය රඳන තැන් ද වර්ධනය කරගත් ගම් වැසියෝ එමගින් ද ප්‍රයෝජන ගත් හ. වැව් පද්ධතිය කළමනාකරණය කිරීම සඳහා වෙල් විදානේ කෙනෙකු පත් කර තිබිණි. වෙල් විදානේ වැව් ජලය බෙදීම, ජලය පාවිච්චියට ගැනීමට ඇති අයිතිය ඇති අය සහ අයිතියේ ස්වභාවය තීරණය කිරීම, වාරි පද්ධතිය නඩත්තුව, වැවෙන් නිෂ්පාදිත අවශේෂ නිෂ්පාදන පාලනය සහ බෙදා හැරීම වැනි සංකීර්ණ සහ වගකීම් සහිත කාර්ය භාරයක් ඉටු කළේය. මේ අනුව, එකල ගම තුළ ආර්ථික සහ ස්වභාවික සම්පත් පාලනය සඳහා ගමේ අයගෙන්ම සැදි ග්‍රාම පරිපාලන ක්‍රමයක් පැවතිණි. දෙන ලද සීමිත කාර්ය කොටස තුළ එය කාර්යක්ෂම පාලන ක්‍රමයක් ද විය.

එකල රජය වර්තමානයේ මෙන් කෙනෙකුගේ උපතේ සිට මරණය දක්වා වූ සෑම ක්‍රියාවලියක් ම ඇතුළත් වූ සුවිශාල පරාසයක කාර්යභාරයක් පවරාගෙන නොතිබිණි. රජය කළේ නීතිය සහ සාමය රැකීම, රාජ්‍ය ආරක්ෂාව, ආගමට අනුග්‍රහ දැක්වීම සහ එය ආරක්ෂා කිරීම, වාරිමාර්ග වැනි යටිතල පහසුකම් ඇති කර ඒවා පවත්වාගෙන යාමට මුල් වීමයි. මේ කරුණු ඔස්සේ සලකා බලන විට එද පැවති ස්වයංපෝෂිත සහ සීමිත ආර්ථිකය තුළ රජයත්, ප්‍රජාවත් අතර මනා ගැලපීමක් තිබූ බව පෙනේ. වර්තමානයේ රාජ්‍යය, ආයතනයක් වශයෙන් භාර නොගත් කාර්යයක් නොමැති තරම් ය. එසේ ම මැදිහත් නොවන ක්ෂේත්‍රයක් නොමැති තරම් ය. කෙනෙක් මව්කුස පිළිසිඳ ගත් අවස්ථාවේ සිට මරණය දක්වා වූ සියලු කටයුතු වල දී ආයතනයක් වශයෙන් එය මැදිහත් වේ. රජය, මහජන සෞඛ්‍ය පහසුකම් සපයයි. ප්‍රාථමික අධ්‍යාපනයේ සිට තෘතීය අධ්‍යාපනය දක්වා නොමිලයේ අධ්‍යාපනය සපයයි. දිනෙන් දිනම යටිතල පහසුකම් සැපයීමට නැඹුරු වේ. මෙහි ප්‍රධාන අංගය වී ඇත්තේ වාරි ජලය, මාර්ග, විදුලිය, විනයුම් (Communication) පානීය ජල පහසුකම් යනාදිය සැපයීමයි. කෘෂිකර්මය සහ සත්ත්ව පාලනය සම්බන්ධයෙන් ද රජය වගකීම් සම්භාරයක් ඉටු කිරීමට බැඳී සිටියි. කෘෂි-සත්ත්ව පර්යේෂණ පැවැත්වීම, තාක්ෂණය ලබාදීම, යෙදවුම් සහ නිපැයුම් වෙළඳපොළ පවත්වාගෙන යාම ඉහත කී කාරණයන්ට උදාහරණ වේ. මෙම කටයුතු ඉටු කිරීම සඳහා රජය ජාතික මට්ටමේ මෙන්ම පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ ද ආයතන සහ සංවිධාන රාශියක් පවත්වාගෙන යයි. ඒ ඒ යුගයන් හි දී

බලයට පැමිණි ආණ්ඩු විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයෙන් සැපයෙන සේවාවන් සඳහා දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ ආයතන විශාල ප්‍රමාණයක් ස්ථාපිත කරමින් මහජන මුදලින් වැටුප් ලබන නිලධාරීන් සුවිශාල ප්‍රමාණයක් නඩත්තු කළ අතර වර්තමානයේ ද එය නොවෙනස්ව පවතී. වැටුප් මෙන්ම විශ්‍රාම දීමනා, අර්ථසාධක අරමුදල්, පාරිතෝෂික, ප්‍රවාහන වියදම්, කාර්යාල නඩත්තු වියදම්, නිල නිවාස සැපයීම් ආදී වශයෙන් මෙම සංවිධාන පවත්වාගෙන යාමට දරන වියදම අති මහත් ය. මේ සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් සපයා ගැනීමට සිදු වන්නේ මහජනතාව වෙත පැටවෙන බදුවලිනි. විදේශීය ණය හෝ ආධාර ලබා ගත්ත ද ඒවා පොලිය සමඟ ගෙවීමට සිදුවන්නේ මෙරට ඉපදුන සහ ඉපදීමට සිටින පිරිස ගෙනි. එසේ වුවද, ඒවා ආයෝජනයේ දී අති මහත් විෂමතාවක් හෝ ප්‍රභේදනයක් නිදහස ලැබූ මුල් යුගයේ පටන් දැකිය හැකි විය. අනෙක් අතට, අනේක විධ අතිමහත් වූ සේවා සහ පහසුකම් සැපයීම සඳහා බිහිකොට ඇති රාජ්‍ය සංවිධාන බොහොමයක් ආන්තික ජන කොටස්වලින් දුරස්ත ය. රජය දුරස්ත වන්නේ දුප්පත් ජන කොටස්, ඈත පිටිසර ජන කොටස් සහ ආන්තික ජන කොටස්වලට සේවා සැපයීමේ දී ය. කවර කාරණා ගෙන හැර පෑව ද (සම්පත් සහ සේවා කාණ්ඩවල හිඟය අඩුපාඩු ආදී) සමහර ජන කාණ්ඩවලට සේවා සැපයීම සම්බන්ධයෙන් සලකා බලන කල රජය දුරස්ත ආයතනයකි. සත්‍ය වශයෙන්ම මෙයට ප්‍රධාන හේතුව වන්නේ සම්පත් හිඟය හෝ වෙනයම් කාරණයකට වඩා ඉහත කී කණ්ඩායම් බල රහිත වීම ය. සමාජ, ආර්ථික සහ දේශපාලන වශයෙන් ආන්තික වීම ය.

වියළි කලාපයේ දැකිය හැකි මෙවන් ගම්මාන සිය ගණනක් අතුරින් පුල්එළිය ගම්මානය ද එකකි. මෙහි දී, විශේෂ අවධානය ඒ කෙරෙහි යොමු වන්නේ වසර පනහකට පෙර එම ගම්මානයේ සමාජ-ආර්ථික ජන විද්‍යාත්මක තත්ත්වයන් පිළිබඳව තොරතුරු පවතින නිසාවෙනි. ඒ බ්‍රිතාන්‍ය ජාතික එඩ්මන් ලීච්ගේ 'Pul Eliya, a Village in Ceylon: A study of land tenure and kinship' (පුල්එළිය- ශ්‍රී ලංකාවේ පිටිසර ගම්මානයක ඉඩම් භුක්තිය සහ නෑදකම පිළිබඳ අධ්‍යයනයකි) පර්යේෂණ ග්‍රන්ථය ඇසුරිනි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය නගරයේ සිට කි.මී. 08ක් පමණ තලෙයි මන්නාරම දෙසට ගමන් කර රඹකුලම හන්දියෙන් තවත් කි.මී. 3ක් පමණ රට අභ්‍යන්තරයට ගමන් කිරීමෙන් පුල්එළිය ගම්මානයට ප්‍රවේශ විය හැකිය. වියළි කලාපයේ පිහිටි කෘෂි ගම්මානයක් වන පුල්එළිය වියළි කලාපයට ආවේණික වූ තුන්පත් ගොවිතැනින් තම ජීවනෝපාය සකසා ගන්නා අති බහු-තරයකින් සමන්විත වේ. එසේ වුව ද, තුලා-වෙල්ලිය, කලවැල්පොතාන, කැලෑපලුගොල්ලෑව, දිවුල්වැව ආදී අසල්වැසි ගම්මාන සමඟ සැසඳීමේ දී පුල්එළිය යම්තාක් දුරට ස්ව උත්සාහයෙන් නැඟී සිටීමට වෙර දරන සීමිත ජල සහ ඉඩම් සම්පතින් යුතු ගම්මානයකි.

වැඩවසම් යුගයේ සිට විවිධාකාර වෙනස්කම්වලට භාජනය වෙමින් පැවත ආ පරිපාලනය සඳහා වූ ආයතනික රටාව නැතහොත් සමාජයීය ආයතනික ව්‍යුහය ගමට වඩාත් සමීප එකක් වූ අතර පුල්එළිය ගම්මානය ද එම සාම්ප්‍රදායික ආයතනික ව්‍යුහයේ ආභාසය නොමඳව ලැබ විකාශය වූවකි. කෙසේ වුව ද, බ්‍රිතාන්‍ය යුගයත් සමඟ එම ආයතනික රටාව ක්‍රම ක්‍රමයෙන් දිය වී යාමට පටන් ගැනීමත්, ඒ වෙනුවට රාජ්‍ය අංශයේ වැටුප් ලබන නිලධාරීන් පිරිසක් වෙත එම වගකීම් පැවරීමත් සමඟ ගමට සේවාවන් සැපයීම, සාමූහිකත්වයෙන් යුතුව වැඩ කටයුතු ඉටුකර ගැනීම, ගම තුළ තිබූ සාම්ප්‍රදායික නායකත්වය, උපදේශකත්වය කිසියම් අන්දමකට වෙනසකට භාජනය වී තිබේ. මෙම වෙනස එක්තරා අන්දමකින් ධනාත්මකව ද, තවත් අතකින් ඍණාත්මකව ද සිදු විය. පුල්එළිය ගම්මානය ද එකී වෙනසින් අත් නො මිදුණු බැවින් සමස්තයක් ලෙස සංවර්ධන ක්ෂෙත්‍රයේ පවතින අඩු ලුහුඩුකම් සහ දුර්වලතාවන්ගෙන් පෙළෙන ගම්මානයකි.

භෞතික දුරස්තබව මෙන්ම සේවාවන් ලබාදීමේ දුරස්තර බවකින් ද යුත් ගම්මානයක් වන පුල්එළිය ප්‍රධාන වශයෙන්ම වාරි ජලය සහ අහස් දියෙන් වගා කටයුතු සිදු කරන

ගම්මානයකි. ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මය වන මෙම ගම්මානයෙහි ඒ සඳහා අවශ්‍ය වන මූලික සාධකය වන ජලය සහ ඉඩම් සීමිත සම්පත් වේ. මහ කන්නයේ මාස 3-4 පමණ වර්ෂාව පවතින අතර මේ කාලයේ දී වාරි සහ වර්ෂාව පදනම් කරගෙන පමණක් වී ගොවිතැන් සිදු කරනු ලබයි. වැසි හිඟ යල කන්නයේ කුඹුරු වගාව අවිනිශ්චිත නිසා ඒ කෙරෙහි වැඩි අවධානයක් යොමු නො කෙරේ. පසුගිය වසර පනහ තුළ ගමේ පැහැදිලි වර්ධනයක් ඇති වූවා නම් ඒ ජනගහනයේ ය. ජන සංඛ්‍යාවේ වර්ධනයත් සමඟ ඔවුන් සියළු දෙනා පෝෂණය කිරීමට වැවෙහි රැඳවිය හැකි ජල ප්‍රමාණයත් එයින් අස්වැද්දිය හැකි කුඹුරු ප්‍රමාණයත් ප්‍රමාණවත් නො වීය. මේ නිසා අළුත් ඉඩම් අස්වැද්දූ අතර කෘෂි ළිං තනා භූගත ජලය ලබා ගැනීමට උත්සාහ දරනු ලැබීය. දැනට භූගත ජලය භාවිතා කරන්නේ වාණිජ භෝග වගාව සඳහා ය. එසේ වූව ද, පුල්එළියේ වාණිජ භෝග වගාව කෙරෙහි නැඹියාව රජයේ මැදිහත් වීමකින් සිදු වූවකට වඩා ගැමියන් විසින් ස්වයං පර්යේෂණයෙන් කෙරෙන්නක් බව පෙනේ. දැනට රජයේ දුරස්ත බව හමුවේ වූව ද, වී වගාව මූලික කොට ගත් යැපුම් කෘෂි කර්මාන්තයේ සිට මාළු මිරිස්, වම්බටු, මැ ලොකු ළූණු වගාවන් මූලික කොටගත් වාණිජ භෝග වගාවට ගම්මානය යොමු වී ඇති අතර සාම්ප්‍රදායික හේන් වගා සඳහා යොදා ගනු ලැබූ බිම් වර්තමානයේ එකී වාණිජ භෝග වගාවන් සඳහා යොදා ගෙන තිබේ. මේ වන විට ගමේ ප්‍රධාන ආදායම් මාර්ගයක් බවට වාණිජ භෝග වගාව පත්ව තිබේ.

කුඹුරු, හේන් සහ ගෙවතු වගාවන් මූලික කර ගත් තුන්පත් රටාවේ කෘෂිකර්මය පදනම් කරගත් ජීවන රටාවකට උරුමකම් කියන වියළි කලාපයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය ඉතාමත් සුවිශේෂී සහ වැදගත්කමක් උසුලනු ලබයි. එවැනි වැදගත්කමක් උසුලන ක්ෂේත්‍රයකට රාජ්‍ය නිලධාරීන්ගේ උපදේශනය, සේවාවන් සහ මැදිහත්වීම් දැඩිව අවශ්‍ය වන බව අවිවාදිත වූව ද, පවුල්වල යැපීම් සඳහා වන කුඹුරු වගාව මෙන්ම වෙළඳපොළාභිමුඛ වාණිජ භෝග වගාව ද ප්‍රධාන ආදායම් මාර්ගයක් වන පුල්එළිය ගම්මානයේ ගැමියන්ට, එවැනි සේවාවන් ලැබීම දුර්ලභ ය. පුල්එළිය ගම්මාන යේ සිදු කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී අනාවරණය වූ අන්දමට එහි දැනට සාර්ථකව ක්‍රියාත්මක වන වාණිජ භෝග වගාව රාජ්‍ය නිලධාරීන්ගේ හෝ රාජ්‍ය නොවන අංශයක දැනුවත් කිරීම් හෝ මැදිහත්වීම් හරහා සිදු වූවක් නොව ගැමියන්ගේ දැනුම, වෙළඳපොළ අනුකරණය සහ අත්දැකීම් තුළ ස්වයං පර්යේෂණ ඔස්සේ සාර්ථකත්වයට පත් වූවකි. රාජ්‍ය අංශය කෘෂිකර්මය සඳහා විශාල වියදමක් දරන පසුබිමක් යටතේ, අතිබහුතරය කෘෂිකර්මය මත යැපෙන ගම්මානයක රාජ්‍ය අංශයෙන් සැපයෙන කෘෂිකාර්මික සේවාවන් ගමට නො ලැබී යාම ඉතා අහිතකර තත්ත්වයක් මතු කරවනු ලබයි.

කෘෂි උපදේශන සේවාවන් නිසි පරිදි නො ලැබීම නිසා වගාවන් සඳහා කෘමිනාශක, වල් නාශක සහ රසායනික පොහොර හිතුමනාපයේ යෙදීමක් ගම්මානයේ වගා බිම් ආශ්‍රිතව දැකිය හැකි අතර මේ මඟින් පරිසර පද්ධතියට දැඩි බලපෑමක් සිදු වන බව නො රහසකි. අනෙක් අතට කෘෂි රසායනික යෙදීමේ දී අනුගමනය කළ යුතු ආරක්ෂිත උපක්‍රම පිළිබඳ දැනුවත් භාවයක් ගැමියන් වෙත නොමැති බව ද පෙනේ. මෙහි වඩාත්ම ශෝචනීය තත්ත්වය වන්නේ ජීවන පැවැත්ම උදෙසා කෘෂි කර්මාන්තයේ යෙදෙන ප්‍රජාවක ජීවිතවලට මෙහි අතුරුඵල හානිදායක ලෙස බලපෑමයි. එනම්, මේ වන විට උතුරු මැද පළාතේ සෞඛ්‍ය අංශවලට ප්‍රබල අභියෝගයක් බවට පත් ව ඇති වකුගඩු රෝගයට එක් හේතුකාරකයක් වශයෙන් කෘෂිකර්මාන්තයේ දී යොදා ගැනෙන රසායනික ද්‍රව්‍යවල යම් මට්ටමක බලපෑමක් පවතින බවට මත ඉදිරිපත් වී තිබේ. එමෙන්ම, නිසි පරිදි උපදේශන සේවාවන් නො ලැබීම නිසා ඇතැම් අවස්ථාවල දී විවිධ කෘමි රෝග හෝ පළිබෝධවලට ලක් වීමෙන් වගා බිම් සම්පූර්ණයෙන්ම විනාශයට පත් වෙමින් ගොවීන් ආර්ථික වශයෙන් දැඩිව පාඩු ලබන තත්ත්වයකට පත්වීමක් ද සිදු වේ. කෙසේ වූව ද, මේ පිළිබඳව අදාළ නිලධාරීන්ගේ මැදිහත්වීමක් දක්නට නොමැති අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී පුල්එළිය ගම්මානයට රාජ්‍ය යනු දුරස්ත ආයතනයක් බවට පත්ව තිබේ.

රාජ්‍ය අංශයෙන් සුවිශාල මුදල් සම්භාරයක් වියදම් කරමින් දීප ව්‍යාප්තව සපයන සේවාවක් වන්නේ අධ්‍යාපනයයි. පුල්එළිය ගම්මානයට ද අධ්‍යාපන අවස්ථා ලබාදීම සඳහා පාසලක් පිහිටුවා ඇත. පාසලේ ලොග් සටහන් අනුව, එය 1927 වසරේ ආරම්භ කර ඇති අතර මේ වන විට විදුහල ආරම්භ කර වසර 82 ක් ගත වී තිබේ. පළමු වසරේ සිට අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ දක්වා ශ්‍රේණිවලින් සැදුම්ලත් පුල්එළිය විද්‍යාලය ගුරු හිඟය මෙන්ම අනෙකුත් සම්පත් හිඟය අතින් ද පීඩා විඳිනු ලබයි. විශේෂයෙන්ම විද්‍යා, ගණිත, ඉංග්‍රීසි ආදී විෂයයන් සඳහා ගුරුවරුන් හිඟවීමත්, ගමේ විද්‍යාලයට පැමිණෙන ගුරුවරුන් පවා ප්‍රවාහන අපහසුතා මෙන්ම ප්‍රදේශයේ පවතින දුෂ්කරතා නිසා දිගු කාලයක් රැඳී නොසිටීම ආදිය ගම්මානයේ පාසල් අධ්‍යාපනය කෙරෙහි අහිතකර අන්දමින් බලපා ඇත. මෙම අපහසුතා නිසා ගමෙන් බැහැර මැදවච්චිය වැනි ආසන්න ප්‍රදේශයක විදුහලක තම දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට උත්සාහ දරන දෙමාපියන්ට වුව ද ඒ සඳහා ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට අපහසුවීම නිසා සම අධ්‍යාපන අවස්ථා යන්න පුල්එළිය ගම්මානයට සිහිනයකි.

පසුගිය වසර 38ක කාලය සලකා බැලීමේ දී පුල්එළිය විද්‍යාලයේ ගුරුවරුන් සංඛ්‍යාත්මකව වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරනු ලබයි. එනම්, 1970 දී ගුරු මණ්ඩලය හත් දෙනෙකුගෙන් සමන්විත වුව ද, 2008 වසර වන විට එය 14 දක්වා වර්ධනය වී තිබේ. ඔවුන්ගෙන් තිදෙනෙකු උපාධි ගුරුවරුන් වන අතර හය දෙනෙකු පුහුණු ගුරුවරුන් ය. ඉතිරි පස් දෙනා ස්වේච්ඡා ගුරු සේවයේ සිට ගුරු සහායකයින් වශයෙන් පත්වීම් ලැබුවෝ වෙති. ගුරු මණ්ඩලය සංඛ්‍යාත්මක වැඩි වුව ද, විභාග ප්‍රතිඵලවලින් අපේක්ෂිත සාධාරණ මට්ටම කරා විද්‍යාලයේ සිසුන් ළඟා වී නොමැති බව පෙන්නුම් කෙරේ. ඉහත කී තත්ත්වය විද්‍යාලයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල තුළින් පැහැදිලිව ම අනාවරණය වේ. 2003 වසරේ දිවයිනේ සාමාන්‍ය පෙළ විභාගයෙන් අඩුම ප්‍රතිඵල ලබාගත් විද්‍යාල අතුරෙන් තුන්වැනි ස්ථානයට පුල්එළිය විද්‍යාලය පත්ව ඇති අතර එම වසරේ විභාගයට පෙනී සිටි ශිෂ්‍යයින් 08 දෙනාම සියලු ම විෂයයන් අසමත් වී ඇත. නදීකා දමයන්ති සහ ධනවර්ධන ගමගේ (2005) ගැටුම් කලාපයන් ට යාබද ගම්මානවල සිදු කළ පර්යේෂණ වාර්තාවෙන් පෙන්වා දෙන අන්දමට 1981-2004 දක්වා වූ වසර 23 ක

**වගුව අංක 01**

**පුල්එළිය විද්‍යාලයෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සහ සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව (2000-2008)**

| වර්ෂය | විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | සියලු ම විෂයයන් සමත් වූ සංඛ්‍යාව | සමත්වීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2000 | 15 | 0 | 0.0 |
| 2001 | 09 | 0 | 0.0 |
| 2002 | 12 | 0 | 0.0 |
| 2003 | 08 | 0 | 0.0 |
| 2004 | 08 | 0 | 0.0 |
| 2005 | 08 | 0 | 0.0 |
| 2006 | 01 | 0 | 0.0 |
| 2007 | 14 | 1 | 7.1 |
| 2008 | 09 | 0 | 0.0 |

*මූලාශ්‍රය: පුල්එළිය විද්‍යාලයේ විභාග ප්‍රතිඵල සටහන්*

කාල පරිච්ඡේදය තුළ පුල්එළිය විද්‍යාලයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 04කි. 2000-2008 කාල පරිච්ඡේදය තුළ පුල්එළිය විද්‍යාලයෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටි සහ සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව වගු සටහන් අංක 01න් ඉදිරිපත් කෙරේ. වසර 27කට පසුව, විද්‍යාලයෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි ශිෂ්‍යයෙකු සමත්වීම සනිටුහන් කරමින් 2007 වසරේ දී එක් ශිෂ්‍යයෙකු පමණක් විෂයයන් සියල්ලම සමත් වී ඇත. වර්තමානයේ පවා අධ්‍යාපනයේ සම අවස්ථා නිසි පරිදි පුල්එළිය ගම්මානයට නොලැබෙන බව තහවුරු වේ. මේ තුළින් පැහැදිලි කරන්නේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ද පුල්එළිය ගම්මානයට රාජ්‍ය දුරස්ත ආයතනයක් වන බවයි.

සෞඛ්‍ය අංශය පිළිබඳව විමසුව ද පුල්එළිය ගම්මානය සම්බන්ධව පැවසිය යුත්තේ ලීච් සඳහන් කරන අන්දමේ සෞඛ්‍ය පහසුකම් පවා මේ වන විට අහිමි වී ඇති බවයි. ඇතැම් අවස්ථාවල දී ප්‍රතිකාර ගැනීමට ගමට ආසන්නව පිහිටි මැදවච්චිය හෝ නේරියකුලම රෝහලට ඇතුළත් කරන පුද්ගලයෙකුට එතැනින් අනුරාධපුර හෝ වවුනියාව රෝහලටත්, අනුරාධපුරයෙන් හෝ වවුනියාවෙන් මහනුවර හෝ කොළඹටත් මාරු කර යැවීමෙන් පසුව පමණක් නිසි ප්‍රතිකාර ලැබේ. මේ සඳහා විශාල කාලයක් ගතවීම මෙන්ම රෝගියාත් පවුලේ අයත් දැඩි ආර්ථික, ප්‍රවාහන සහ වෙනත් දුෂ්කරතාවන්ට මුහුණදීමක් ද සිදු වේ. සෞඛ්‍ය පහසුකම් සහ සේවාවන් හි ධනාත්මක වෙනසක් ශ්‍රී ලංකාව තුළ පැවතිය ද එම පහසුකම් පුල්එළිය වැනි දුරස්තව පිහිටි ගම්මාන සඳහා ප්‍රමාණවත්ව නොලැබෙන බව මේ අනුව තහවුරු වේ.

පසුගිය වසර කිහිපය තුළ මහාමාර්ග පද්ධතියේ යම් වර්ධනයන් සිදු වී ඇතත් ලීච් තම පර්යේෂණ ග්‍රන්ථයේ සඳහන් කරන මාර්ග පහසුකම්වලින් දැඩිව ඔබ්බට ගිය පහසුකම් ජාලයක් ඉන් වසර 50කට වැඩි කාලයක් ගත වී හෝ දක්නට නො ලැබේ. 1954 දී පුල්එළියේ සිට මෝටර් රථයකින් අනුරාධපුරයට පැයකින් ළඟාවීමට හැකි යැයි ලීච් සඳහන් කළ මාර්ගය පවා වර්තමානය වන විට අබලන් තත්ත්වයට පත්ව ඇති අතර එම ගමන සඳහා වර්තමානයේ ලීච් සඳහන් කරන කාලය මෙන් දෙගුණයක පමණ කාලයක් වැය කිරීමට සිදු වේ. එමෙන්ම, ප්‍රදේශවාසීන්ට ප්‍රවාහන පහසුකම් සැපයූ පහසුම ප්‍රවාහන ජාලය වන දුම්රිය ප්‍රවාහන පද්ධතිය ද පසුගිය දශක තුනක පමණ කාලය තුළ පැවති යුද්ධය නිසා ප්‍රදේශවාසීන්ට අහිමි වී ඇත.

බාහිර ලෝකය සමඟ සම්බන්ධවීම, සන්නිවේදනය, දැනුම ලබා ගැනීම ආදී ජන ජීවිතය සමඟ බැඳී පවතින අංශ ගණනාවකට බලපෑම් කරනු ලබන මාර්ග පද්ධතිය එක්තරා මට්ටමක දියුණුවක් ලබා ඇතත් පොදු ප්‍රවාහන සේවාවන් සතුටුදායක මට්ටමකින් ක්‍රියාත්මක නොවේ. 1970 දශකයේ සිට රාජ්‍ය අංශයට අයත් එක් බස් රථයක් පමණක් මෙම මාර්ගය ඔස්සේ ප්‍රවාහන පහසුකම් සලසමින් තිබුණ ද, වසර කිහිපයක් තිස්සේ එය ද ගමට අහිමි වී තිබේ. ප්‍රවාහන අපහසුතාව අංශ ගණනාවක ගැටලු ජනිත කොට ඇති අතර අධ්‍යාපන, සෞඛ්‍ය, සේවාවන් කෘෂි සහ පශු ව්‍යාප්ති සේවා ආදී අංශ කෙරෙහි එය සෘජුවම බලපා ඇත. ගමට සේවාවන් නො ලැබී යාමේ එක් ප්‍රධාන හේතුවක් වශයෙන් දුර්වල ප්‍රවාහන පද්ධතිය හඳුනාගත හැකිය.

ඉහත සියලු කරුණු විශ්ලේෂණයේ දී පැහැදිලි වන්නේ ජන ජීවිතයට සෘජුවම සම්බන්ධ වන අංශ බොහෝමයක දී පුල්එළියට රාජ්‍ය අංශය දුරස්ත වී ඇති බවයි. නොඑසේ නම් රාජ්‍ය අංශයේ අකාර්යක්ෂමතාව (Inept) හෝ රජයේ සංවර්ධන පරිපාලනයේ ප්‍රමාණවත් නොවීම (Inadequacy), මේ සඳහා බලපා ඇති බවයි.

**නදීකා දමයන්ති**
**පර්යේෂණ නිලධාරිණී**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**